සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

# 61 - භූගෝල විද්‍යාව


## ලකුණු දීමේ පටිපාටිය







Spain




Department of Examinations - Sri Lanka

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 61 - භූගෝල විද්‍යාව I, II

## අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය**

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) ලකුණු 40

**II පත්‍රය**

**I කොටස**

1. ප්‍රශ්නය ලකුණු 20

**II කොටස**

| | | |
|---|---|---|
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04 කට ලකුණු 40 |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 8. ප්‍රශ්නය | ලකුණු 10 | |

**I පත්‍රය** ලකුණු 40

**II පත්‍රය** ලකුණු 60

**අවසාන** ලකුණු 100

Department of Examinations - Sri Lanka

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ..................................................... | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ..................................................... | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ..................................................... | √ | △ $\frac{3}{5}$ |
| (03) | එකතුව | → | □ $\frac{10}{15}$ |

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

Department of Examinations - Sri Lanka

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

## භූගෝල විද්‍යාව 1 වන පත්‍රය
## ඉගෙනුම් පල

1. ගෝලීය ජල ව්‍යාප්තිය විස්තර කරයි.
2. ලෝකයේ ප්‍රධාන දේශගුණ කලාප හා උප කලාප නම් කරයි.
3. ලෝකයේ ප්‍රධාන කඳු පද්ධතිවල ව්‍යාප්තිය දක්වයි.
4. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය හා සම්බන්ධ ගැටලු ඉදිරිපත් කරයි.
5. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය හා සම්බන්ධ ගැටලු ඉදිරිපත් කරයි.
6. පාංශු හරස් පැතිකඩක ගති ලක්ෂණ පෙන්වා දෙයි.
7. ශිලා ගෝලයේ පාෂාණ ව්‍යාප්තිය විස්තර කරයි.
8. ලෝකයේ වනාන්තරවල ව්‍යාප්තිය විස්තර කරයි.
9. ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු සීමාව දක්වයි.
10. ශ්‍රී ලංකාවේ 1:50,000 භූලක්ෂණ සිතියම්වල දැක්වෙන පර්යන්ත තොරතුරු විවරණය කරයි.
11. ශ්‍රී ලංකාවේ වතුභෝග ව්‍යාප්තිය විස්තර කරයි.
12. ශ්‍රී ලංකාවේ බහුලව ප්‍රයෝජනයට ගන්නා ඛනිජ වර්ගවල ව්‍යාප්තිය විස්තර කරයි.
13. ලෝක ජන සංඛ්‍යාවේ විශේෂ ලක්ෂණ ප්‍රස්තාර ඇසුරින් පෙන්වා දෙයි.
14. මානව සම්පත සංවර්ධනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.
15. ශ්‍රී ලංකාවේ ස්වාභාවික උපද්‍රවවලින් සිදුවන හානි පෙන්වා දෙයි.
16. ශ්‍රී ලංකාවේ 1:50,000 භූලක්ෂණ සිතියම්වල ඇති භෞතික හා සංස්කෘතික ලක්ෂණ විවරණය කරයි.

Department of Examinations - Sri Lanka

OL/2020/61/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය :..................................

## භූගෝල විද්‍යාව I

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ..ඉන්දු ඕස්ට්‍රේලියානු.. තැටිය මත ය.
(අරාබියානු / අප්‍රිකානු / ඉන්දු ඕස්ට්‍රේලියානු)

**2.** ගෝලීය මුළු ජල ප්‍රමාණයෙන් ........97.5%.......... ක් සාගර ජලය වේ.
(97.5% / 79% / 71%)

**3.** පාංශු පැතිකඩක මහල් තුන අතුරින් හියුමස් පස අඩංගු වන්නේ ..........A................. මහල තුළ ය.
(A / B / C)

**4.** මධ්‍යධරණී දේශගුණය, ලෝකයේ ..සෞම්‍ය............ දේශගුණික කලාපය තුළ දක්නට ලැබෙන විශේෂ දේශගුණ වර්ගයකි.
(නිවර්තන / සෞම්‍ය / ශීත)

**5.** දකුණු ඇමරිකාවේ පිහිටා ඇති ප්‍රධාන කඳු පන්තිය ...ඇන්ඩීස්........ නමින් හැඳින්වේ.
(කෝඩිලේරා / ඇන්ඩීස් / රොකී)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** මිනිරන් වටිනා ලෝහමය ඛනිජ සම්පතකි. නි (වැ)

**7.** ශ්‍රී ලංකාවේ පස් වර්ග අතුරින් රතු දුඹුරු ලැටසෝල් පස තෙත් කලාපයට ආවේනික පස් වර්ගයකි. (නි) වැ

**8.** ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 65%ක් පමණ ජනහීන ප්‍රදේශ වේ. (නි) වැ

**9.** දේශීය කිරි නිෂ්පාදනය මගින් ශ්‍රී ලංකාවට අවශ්‍ය සම්පූර්ණ කිරි ප්‍රමාණය සපයනු ලැබේ. නි (වැ)

**10.** හරිතාගාර ආවරණය නිසා පෘථිවිය තුළ ජීවීන්ගේ පැවැත්මට හිතකර වායුගෝලයක් නිර්මාණය වේ. (නි) වැ

- අංක 11 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** පෘථිවි අභ්‍යන්තරයේ උණු වූ මැග්මා පොළොව මතුපිටට පැමිණ සිසිල්වීමෙන් ...නිම්ක්‍රාන්ත... ආග්නේය පාෂාණ නිර්මාණය වේ.


**12.** උතුරු අර්ධගෝලයේ අක්ෂාංශ 50° සිට 60° අතර කලාපයෙහි ...කේතුධර... වනාන්තර ව්‍යාප්ත වී ඇත.

**13.** ශ්‍රී ලංකාවට අයත් රාජ්‍ය මුහුදු සීමාව ලෙස සැලකෙන්නේ වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් ...12... දක්වා කලාපයයි.

**14.** ලෝකයේ වැඩියෙන් ම නිෂ්පාදනය හා පරිභෝජනය කෙරෙන ධාන්‍ය වර්ගය ...තිරිඟු... ය.

**15.** කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා යන අංශ තුන අතුරින් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් වැඩි පිරිසක් රැකියාවල නිරත වී ඇත්තේ ...සේවා... අංශයෙහි ය.

- අංක 16 සිට 19 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන් උපයෝගී කර ගන්න. 2019 වර්ෂයේ ලෝකයේ රටවල් තුනක වයස් ව්‍යුහය අනුව ජන සංඛ්‍යාව දැක්වෙන ප්‍රස්තාර තුනක් පහත Ⓐ, Ⓑ හා Ⓒ වලින් දක්වා ඇත.




මූලාශ්‍රය - https://www.populationpyramid.net/

**16.** ළමා යැපෙන්නන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගන්නා රට දැක්වෙන අක්ෂරය කුමක් ද? ...A...

**17.** ජන හායනයක් සිදු වෙමින් පවතින බව දැකිය හැකි රට දැක්වෙන අක්ෂරය කුමක් ද? ...B...

**18.** ජන සංඛ්‍යා වර්ධනය බොහෝදුරට ස්ථාවර මට්ටමක් පෙන්නුම් කරන රට දැක්වෙන අක්ෂරය කුමක් ද? ...C...

**19.** ආයු අපේක්ෂාව පහළ මට්ටමක පවතී යැයි සිතිය හැකි රට දැක්වෙන අක්ෂරය කුමක් ද? ...A...

- අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ' | 'ආ' |
|---|---|
| **භෝගය** | **වගාවට වැදගත් දිස්ත්‍රික්ක** |
| 1. තේ | A - කළුතර |
| 2. රබර් | B - හම්බන්තොට |
| 3. පැගිරි | C - බදුල්ල |
| | D - මොණරාගල |

(1) A, B, C (2) A, C, D (3) C, A, B (4) C, B, A (...3...)

Department of Examinations - Sri Lanka

**21.** 'අ' — ධීවර කටයුතු හා සම්බන්ධ ස්ථාන / 'ආ' — ධීවර කටයුතු

| 'අ' ධීවර කටයුතු හා සම්බන්ධ ස්ථාන | 'ආ' ධීවර කටයුතු |
|---|---|
| 1. මයිලෙඩ්ඩි | A - ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය |
| 2. පැලියගොඩ | B - ප්‍රධාන මාළු තොග වෙළඳසැල |
| 3. කල්පිටිය | C - මසුන් ගොඩබාන ධීවර වරාය |
| | D - මසුන් වියළීම හා ඉස්සන් වගාව |

(1) A, B, C (2) B, D, C (3) C, B, A (4) C, B, D (...4...)

**22.**

| 'අ' වායුගෝලීය ස්තර | 'ආ' විශේෂ ලක්ෂණ |
|---|---|
| 1. පරිවර්තී ගෝලය | A - ඕසෝන් ස්තරය පිහිටා ඇත |
| 2. අපරිවර්තී ගෝලය | B - පෘථිවි පෘෂ්ඨයේ සිට 8 km - 12 km පමණ දක්වා ඉහළට විහිදේ |
| 3. මෙසෝ ගෝලය | C - වායුගෝලයේ අඩුම උෂ්ණත්වය මෙම කොටසේ පවතී |
| | D - උෂ්ණත්වය ඉතා අධික ස්තරය මෙයයි |

(1) A, B, C (2) B, A, C (3) B, C, D (4) C, B, D (...2...)

**23.**

| 'අ' ඛනිජ වර්ගය | 'ආ' ව්‍යාප්තව ඇති ප්‍රදේශ |
|---|---|
| 1. සිලිකාවැලි | A - නිලාවෙලි |
| 2. ඉල්මනයිට් | B - බලංගොඩ |
| 3. සර්කොන් | C - මාරවිල |
| | D - එප්පාවල |

(1) A, B, C (2) B, D, C (3) C, A, B (4) D, A, B (...3...)

**24.**

| 'අ' මෙට්‍රික් සිතියම්වල සංස්කෘතික ලක්ෂණ පෙන්වීමට භාවිත කර ඇති වර්ණ | 'ආ' සංස්කෘතික ලක්ෂණ |
|---|---|
| 1. කහ පැහැය | A - දුම්රිය මාර්ග |
| 2. රතු පැහැය | B - ගෙවතු |
| 3. කළු පැහැය | C - පාසල |
| | D - වාරි ඇළ |

(1) A, B, C (2) B, C, A (3) B, C, D (4) D, B, A (...2...)

● අංක **25** සිට **36** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** පහත A සිට E දක්වා ඇති තොරතුරු අතුරින් තිරිඟු වගාවට අදාළ තොරතුරු දෙකක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A – ඒකබෝග වගාවක් වීම හා ගොවිබිම් විශාල වීම
B – මිශ්‍රබෝග වගාවක් වීම හා කුඩා ගොවිපළවල් ලෙස සංවිධානය වී තිබීම
C – මහා පරිමාණ වශයෙන් යාන්ත්‍රීකරණයට භාජනය වී තිබීම
D – පැළ වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය හා චර්නොසම් පස
E – දියළු පස සහිත තැනි බිම්වල ව්‍යාප්ත වීම

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) D හා E ය. (...2...)

**26.** අකුණු වර්ග අතුරින් ප්‍රජාවට සෘජුවම බලපාන්නේ,
(1) පෘථිවි අකුණු ය. (2) වායු අකුණු ය. (3) වලා අකුණු ය. (4) සංවහන අකුණු ය. (...1...)

**27.** ලෝකයේ කපු වගා කරන ප්‍රධාන රටවල් යුගලය වනුයේ,
(1) චීනය හා ඉන්දියාව ය. (2) ඊජිප්තුව හා දකුණු කොරියාව ය.
(3) ජපානය හා උගන්ඩාව ය. (4) පකිස්තානය හා ඕස්ට්‍රේලියාව ය. (...1...)

**28.** උතුරු අත්ලාන්තික් සාගරය ආශ්‍රිතව හටගන්නා සුළි සුළං හඳුන්වනු ලබන විශේෂ නාමය වන්නේ,
(1) විලි විලීස් ය. (2) හරිකේන් ය. (3) ටයිෆූන් ය. (4) බැගියෝ ය. (...2...)

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

**29.** මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍යවන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සිදුවන්නේ,
(1) පරිවර්තිගෝලය තුළ ය. (2) ශිලා ගෝලය තුළ ය.
(3) අපරිවර්තීගෝලය තුළ ය. (4) ජෛව ගෝලය තුළ ය. (..4..)

**30.** විපරීත පාෂාණ දෙකක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දියමන්ති, කිරි ගරුඬ (2) හුණුගල්, ගල් අඟුරු
(3) මිනිරන්, ජිප්සම් (4) දියමන්ති, ගල් අඟුරු (..1..)

**31.** කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතු කොටගෙන ලෝකයේ දැඩි පසුබෑමකට ලක් වූ ආර්ථික කටයුත්ත වූයේ,
(1) ආහාර නිෂ්පාදනයයි. (2) ඇඟලුම් කර්මාන්තයයි.
(3) නිෂ්පාදිත භාණ්ඩ අපනයනයයි. (4) සංචාරක ව්‍යාපාරයයි. (..4..)

**32.** ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සම්බන්ධ සත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) වැඩිම මසුන් ප්‍රමාණයක් අල්ලා ගනු ලබන්නේ ගැඹුරු මුහුදෙනි.
(2) තාක්ෂණික ක්‍රම භාවිතය ඉහළ මට්ටමක පවතී.
(3) මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කළ ද ධීවර කර්මාන්තය අතින් ස්වයංපෝෂිත මට්ටමක නැත.
(4) වෙරළාසන්න ධීවර කර්මාන්තයේ ඒකාධිකාරය බහුජාතික සමාගම් සතුව ඇත. (..3..)

**33.** රටක මානව සම්පත් සංවර්ධනය සඳහා ගත හැකි වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ,
(1) යහපත් ආකල්ප වර්ධනය කිරීමයි. (2) කායික හා මානසික කුසලතා වර්ධනය කිරීමයි.
(3) යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමයි. (4) රැකියා අවස්ථා ලබාදීමයි. (..2..)

**34.** තාක්ෂණික දියුණුව හේතුකොට ගෙන අනාගත ලෝකය මුහුණපාන බලවත් පරිසර ගැටළුවකට හේතුවන ප්‍රධාන කරුණක් වන්නේ,
(1) ඛනිජතෙල් සාගර ජලයට මිශ්‍රවීමයි.
(2) ප්ලාස්ටික් අපද්‍රව්‍ය සාගරයට මුදා හැරීමයි.
(3) මානුෂ ක්‍රියාකාරකම් නිසා වනාන්තර ප්‍රතිශතය අඩු වීමයි.
(4) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමයි. (..4..)

**35.** ග්‍රාස්කාප්, සිල්වර්කාප්, කැට්ලා, ගුරාමි වැනි මත්ස්‍ය වර්ග අල්ලා ගනු ලබන්නේ,
(1) ගැඹුරු මුහුදෙනි. (2) වෙරළාසන්න නොගැඹුරු මුහුදෙනි.
(3) මිරිදිය ජලාශවලිනි. (4) කලපු වැනි කිවුල්දිය ජලාශවලිනි. (..3..)

**36.** පාංශු ස්තර අතර තැන්පත් වී ඇති ජලය හඳුන්වනු ලබන්නේ,
(1) භූතල ජලය යනුවෙනි. (2) භූගත ජලය යනුවෙනි.
(3) පාංශු ජලය යනුවෙනි. (4) පාරගම්‍ය ජලය යනුවෙනි. (..2..)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **37** සිට **40** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. පොසිල ඉන්ධන දහනය
2. පුනර්ජනනීය බලශක්ති

B - 1. සංක්‍රමණ
2. ජන සංඛ්‍යාව

C - 1. භූමි පරිහරණය
2. පාංශු ඛාදනය

D - 1. ගෝලීය උණුසුම
2. සූර්යලප

**37.** පළමුවැන්නේ අහිතකර ප්‍රතිඵල අවම කිරීමට දෙවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..1..)

**38.** පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්න හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..4..)

**39.** දෙවැන්නේ වැඩිවීමට මෙන් ම අඩුවීමට ද පළමුවැන්න හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..2..)

**40.** පළමුවැන්නේ අවිධිමත් බව දෙවැන්නට හේතුවක් වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..3..)

* *

[අනෙක් පිටුව බලන්න

Department of Examinations - Sri Lanka

# II පත්‍රය

## ඉගෙනුම් පල

1. • ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල ඇතුලත් භෞතික හා සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
   • භූගෝල විද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.
   • භූගෝල විද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.

2. • ශිලා ගෝලයේ ව්‍යුහය රූප සටහනක් ඇසුරින් විස්තර කරයි.
   • ශිලා ගෝලයේ ස්තරවල මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
   • ශිලා ගෝලයේ පැවැත්මට තර්ජනයක් වන අහිතකර මානුෂ ක්‍රියාවලි පෙන්වා දෙයි.

3. • ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග නම් කරයි.
   • ශ්‍රී ලංකාවේ පොල්වගාව හා සම්බන්ධ ගැටලු විස්තර කරයි.
   • ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පොල් කර්මාන්තය දියුණු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

4. • ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු වගාවන්ගේ ව්‍යාප්තිය විස්තර කරයි.
   • ශ්‍රී ලංකාවේ එළවළු ගොවීන් මුහුණපා ඇති ගැටලු පෙන්වා දෙයි.
   • ශ්‍රී ලංකාවේ පළතුරු නිෂ්පාදනය මඟින් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීමට ගතයුතු ක්‍රියා මාර්ග පැහැදිලි කරයි.

5. • ලෝකයේ කර්මාන්ත ස්ථාන ගතවීමට බලපාන සාධක වර්ග කරයි.
   • ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තයේ ප්‍රවනතා විස්තර කරයි.
   • ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්තකරුවන් මුහුණුපාන ගැටලු විස්තර කරයි.
   • ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්තකරුවන්ගේ ගැටලු විසඳීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග යෝජනා කරයි.

6. • ලෝකයේ ක්ෂය වෙමින් පවතින ස්වාභාවික සම්පත් නම් කරයි.
   • ශ්‍රී ලංකාවේ පස පරිහණය සම්බන්ධ ගැටලු විස්තර කරයි.
   • ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් භාවිතයේදී පැන නගින ගැටලු නම් කරයි.

Department of Examinations - Sri Lanka

- ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් භාවිතයේදී පැන නගින ගැටලු වලක්වා ගැනීමේ ක්‍රියා මාර්ග යෝජනා කරයි.

7. 
- ලෝකයේ නියඟ උපද්‍රවය හටගන්නා ප්‍රදේශ නම් කරයි.
- නියඟ උපද්‍රව නිසා හටගන්නා ගැටලු පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවට බලපාන නායයෑම් උපද්‍රව වලින් සිදුවන ආපදා අවම කර ගැනීමේ ක්‍රියා මාර්ග පැහැදිලි කරයි.

8. 
- ගෝලීය උණුසුම්වීම කෙරෙහි බලපාන හේතු වර්ග කර දක්වයි.
- ගෝලීය උණුසුම ඉහළ යාම නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම් විස්තර කරයි.
- ගෝලීය උණුසුම ඉහළයාම අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කරයි.

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

## භූගෝල විද්‍යාව II

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.
අංක (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(කඩොලාන / වෙරළ ආරක්ෂක වැටි / වැලි තලාව) (ලකුණු 01 යි)

(ii) Ⓑ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ලඳු කැලෑ / වගුරු බිම / තණ බිම) (ලකුණු 01 යි)

(iii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති රෝස පැහැයෙන් යුතු ප්‍රදේශය කුමක් ද?
(ඉදිකළ ප්‍රදේශයකි / සංචාරක කලාපයකි / රක්ෂිත ප්‍රදේශයකි) (ලකුණු 01 යි)

(iv) Ⓓ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(රාෂ්ට්‍රීය මුහුදු සීමාව / මහාද්වීප තටක සීමාව / සම ගැඹුරු රේඛාව) (ලකුණු 01 යි)

(v) Ⓔ අක්ෂරයෙන් දක්වා ඇති පරිපාලන මායිම කුමක් ද? (ලකුණු 01 යි)

(vi) Ⓕ අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති ප්‍රදේශයෙහි දක්නට ලැබෙන පොදු සේවා සපයෙන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් **හි** /✓ යන්න ද වැරදි නම් **වැ** /✗ යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) සිතියම් ප්‍රදේශයේ ප්‍රධාන ව්‍යාපාරික භෝගය පොල් ය. (ලකුණු 01 යි)

(viii) සිතියම් ප්‍රදේශයේ ප්‍රධාන ගංගාව අවට හේන් ගොවිතැන බහුලව ව්‍යාප්ත වී ඇත. (ලකුණු 01 යි)

(ix) ප්‍රදේශයේ වී වගාව සිදු කෙරෙන්නේ වර්ෂා ජලයේ උපකාරයෙනි. (ලකුණු 01 යි)


81169

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020**
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

**භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II**




SCALE : 1 : 50 000

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

විභාග අංකය / சுட்டெண் / Index Number ..............................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

| | පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் For Examiner's Use Only |
|---|---|
| **1.** (අ) /(அ) /(a) | |
| (i) වැලිකලාව | 1 |
| (ii) වගුරු බිම | 1 |
| (iii) ඉදිකළ ප්‍රදේශයයි | 1 |
| (iv) සම ගැඹුරු රේඛාව | 1 |
| (v) උප දිසාපති කොට්ඨාස මායිම / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම | 1 |
| (vi) තානායම / පොලීසිය / රෝහල (ඕනෑම දෙකක් නම් කිරීම) | 1 |
| | 1 |
| (vii) ඔව් ✓ | 1 |
| (viii) ඔව් ✓ | 1 |
| (ix) නැ ✗ | 1 |
| | 10/10 |

[නවවැනි පිටුව බලන්න/பக். 9 ஐப் பார்க்க/See page nine

Department of Examinations - Sri Lanka

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක 9) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා එය සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) **කැලිෆෝර්නියා අර්ධද්වීපය** - Ⓦ, Ⓧ, Ⓨ

(ii) මෑතක දී භූමිකම්පාවක් හේතුකොට ගෙන මහත් හානි සිදු වූ රටක් වන **තුර්කිය** - Ⓝ, Ⓞ, Ⓟ

(iii) ඉන්දියාව විසින් අනාගතයේ දී භාණ්ඩ ප්‍රතිනැව්ගත කිරීමේ වරායක් ඉදි කිරීමට යෝජිතව ඇති **අන්දමන් දූපත්** - Ⓡ, Ⓢ, Ⓣ

(iv) **පැම්පාස් තණබිම්** - Ⓚ, Ⓛ, Ⓜ

(v) **සිඩ්නි නගරය** - Ⓑ, Ⓒ, Ⓓ

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව (පිටු අංක 9) යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) මෑතක දී සංවර්ධනය කරන ලද **පලාලි ගුවන් තොටුපල** - Ⓖ, Ⓗ, Ⓙ

(ii) පරිසරවේදීන්ගේ අවධානයට ලක්ව ඇති **ආනවිලුන්දාව අභය භූමිය** - Ⓐ, Ⓑ, Ⓒ


(iii) **බියගම** අපනයන සැකසුම් කලාපය - Ⓓ, Ⓔ, Ⓕ

(iv) **සංගමන්කන්ද තුඩුව** - Ⓞ, Ⓟ, Ⓡ

(v) මෑතක දී ඉදිකොට අවසන් වූ **මොරගහකන්ද ජලාශය** - Ⓚ, Ⓛ, Ⓜ (ලකුණු 05 යි)

Department of Examinations - Sri Lanka


(ආ) /(ஆ) /(b)




(i) W
(ii) O
(iii) R
(iv) L
(v) D

5/5

(ඉ) /(இ) /(c)




(i) G
(ii) C
(iii) E
(iv) O
(v) L


5/5

1. (අ) (அ) (a) $\frac{10}{10}$ (ආ) (ஆ) (b) $\frac{5}{5}$ (ඉ) (இ) (c) $\frac{5}{5} = \frac{20}{20}$

Department of Examinations - Sri Lanka

## II කොටස

**2.** රූපයෙන් දක්වා ඇත්තේ පෘථිවියේ ව්‍යුහය හා ස්තර දක්වන හරස්කඩකි.




(i) (a) A හා B ස්තර අතර සීමාව ලෙස අංක ① න් දක්වා ඇති අසන්තතියෙහි නම ද

(b) C හා D ස්තර අතර සීමාව ලෙස අංක ② න් දක්වා ඇති අසන්තතියෙහි නම ද පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(ii) A ස්තරයෙහි ව්‍යුහය ආශ්‍රිතව දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශිලාගෝලයට විවිධ බලපෑම් සිදුවන මිනිස් කටයුතු **තුනක්** නම් කර ඉන් **එකකින්** සිදුවන බලපෑම පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

. (i) (a) මෙහොරොවිසික්

(b) ගුටෙන්බර්ග්

(i) (a) 1 + (b) 1 = **ලකුණු 02**

(ii)
- ශිලාගෝලයට අයත්ය.
- පෘථිවි ස්කන්ධයෙන් 1% පමණ ඊට අයත් වේ.
- ඝනකම ඒකාකාරී නොවේ - සාගරවලදී 5 km වන අතර, මහාද්වීපවලදී 60 km පමණ ගැඹුරටද විහිදේ.
- පාෂාණවලින් සමන්විතය.
- ප්‍රයෝජනවත් ඛනිජ වර්ග රාශියක් අන්තර්ගත වේ.
- ඉහළම තුනී ස්ථරය පස වන අතර එය ජෛව පරිසරය මඟින් නිරතුරුව වර්ධනය වේ. කෘෂිකර්ම කටයුතුවලදී වැදගත් වන්නේ මෙම තුනී ස්තරයයි.
- පාෂාණවල ඝනත්වය හා සංයුතිය අනුව මෙම ස්තරය කොටස් දෙකකට බෙදේ. -
- මහාද්වීපික කබොල • සාගරික කබොල.
- මහාද්වීපික කබොල ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විතය. මූලික වශයෙන් සිලිකා (Silica) හා ඇලුමිනියම්වලින් (Aluminium) යුක්ත බැවින් "සියල්" ස්තරය ලෙස හැඳින්වේ.
- සාගරික කබොල බැසෝල්ට් පාෂාණවලින් සමන්විතය. ඒවා මූලික වශයෙන් සිලිකා (Si) සහ මැග්නීසියම් (Mag) යුක්ත බැවින් "සිමැග්" (Simag) ස්තරය ලෙස හැඳින්වේ.
- සියල් ස්තරය දරා සිටින මූලික පාෂාණ ස්තරය සිමැග් ස්තරයයි.

**මෙවැනි ලක්ෂණ තුනක් සඳහන් කිරීමට**

**(ii) 1X3** = ලකුණු 03

Department of Examinations - Sri Lanka

(iii) • ඛනිජ සම්පත් ලබා ගැනීමට පොළොව කැනීමේදී සිදුවන භූමි හායනය.

• වනාන්තර එළිකිරීම නිසා භූමිය නිරාවරණය වීමෙන් පාංශු ඛාදනය තීව්‍ර වීම හා පාංශු නිර්මාණ ක්‍රියාවලියට බාධා ඇතිවීම.

• මතුපිට භූ දර්ශනය වෙනස්වීම.

• භූගත ජල මට්ටම වෙනස්වීම.

• කම්හල් හා නිවෙස්වලින් සිදුවන අප ද්‍රව්‍ය බැහැරකරීම මගින් ශිලාගෝලයේ ඇතැම් ස්තරවලට හානි සිදුවීම.

• විශාල ජලාශ වැනි ඉදිකිරීම් නිසා ශිලාගෝලයේ සමබරතාව බිඳ වැටීම.

**(iii) මෙවැනි කරුණු තුනක් දැක්වීමට ලකුණු** = 03
**එකක් විස්තර කිරීමට ලකුණු** = <u>02</u>
<u>05</u>

**3.** (i) ලෝක කෘෂිකාර්මික භූමි පරිභෝගයේ ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ වතු කෘෂිකර්මය යටතේ කෙරෙන පොල් වගාව සම්බන්ධයෙන් වර්තමානයේ මතු වී ඇති ගැටළු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පොල් කර්මාන්තය දියුණු කිරීම වැදගත් වන්නේ ඇයිදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(i) (1) පාරිභෝගික/ යැපුම් කෘෂිකර්මය
(2) ව්‍යාපාරික / වාණිජ කෘෂිකර්මය

**(I) 1 + 1 = ලකුණු** 02

(ii) • ඉඩම් කැබලි වීම.
• පොල් ඉඩම් වෙනත් අවශ්‍යතා සඳහා යෙදවීම (ඉඩම් කැබලි කර විකිණීම).
• ජන සංඛ්‍යාව වැඩිවීමත් සමග නිවාස හා සංවර්ධන කටයුතුවලට ඉඩම් යෙදවීම.
• එකම බිමක දීර්ඝකාලීනව වගාව සිදු කිරීම නිසා ඵලදාව අඩුවීම (වගාව පැරණිවීම).
• ඉඩම් භුක්තියේ ගැටලු නිසා ණය සහනාධාර ලබා ගැනීමේ අපහසුව.
• දේශීය පරිභෝජනය අධිකවීම නිසා අපනයන සීමාවීම.
• කෘමි හා වසංගත රෝගවලට ලක්වීම - පොල් කුරුමිණි රෝගය - මයිටා ආක්‍රමණ.
• දැඩි නියඟ කාලවලදී වගාවට හානි සිදුවීම.
• පොහොර භාවිතය අඩුවීම.
• වගා කලමනාකරණය සම්බන්ධ ගැටළු.

**(iii) මෙවැනි ගැටළු තුනක් නම් කිරීමට**
**1X3 = ලකුණු** 03

Department of Examinations - Sri Lanka

(iii) • පොල් නිෂ්පාදන මඟින් දේශීය හා විදේශීය වශයෙන් විශාල ආදායමක් ලැබිය හැකිවීම.

• අනෙකුත් ව්‍යාපාරික වගාවන් හා සැසඳීමේදී නිෂ්පාදන විවිධාංගකරණය කිරීමේ ඉහළ හැකියාවක් පොල් කර්මාන්තය සතුව ඇත.

• කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයීමේ හැකියාව පැවතීම (අහාර වර්ග/ බීම වර්ග/ ගෘහ භාණ්ඩ/ කලාත්මක නිර්මාණ/ සත්ව ආහාර/ විවිධ උපකරණ)

• පොල්ගසේ සෑම කොටසකින්ම කුමක් හෝ නිෂ්පාදනයක් කළ හැකි වීම - (කොහු/ කොහු බත්/ පොල් ලෙලි/ ඉරටු/ පොල් කටු/ පොල් මදය/ තැඹිලි, කුරුම්බා/ පොල් තෙල්/ පොල් කිරි/ පොල් කිරිපිටි/ පොල් රා/ විනාකිරි/ පොල් පැණි/ කපාපු පොල්/ ලී දඬු)

• නව රැකියා උත්පාදන හැකියාව.

• පොල් ආශ්‍රිත කර්මාන්ත බෙහෝමයක් අඩු ප්‍රාග්ධන යෙදවුමකින් ඇරඹිය හැකි වීම.

• පොල් කර්මාන්තයේදී විශාල යන්ත්‍ර සූත්‍ර අනවශ්‍ය වීම - බොහෝවිට අතින් ක්‍රියා කරවන යන්ත්‍ර හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන කුඩා යන්ත්‍ර භාවිත කළ හැකිවීම.

• පොල් ආශ්‍රිත කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා විශාල ඉඩකඩක් අවශ්‍ය නොවීම.

• ශ්‍රී ලංකාවේ වගාවන් සඳහා යොදවා ඇති ඉඩම් ප්‍රමාණයෙන් 28% ක් පමණ පොල් වගාවට යෙදී තිබීමත්, සෑම පළාතකම පාහේ ගෙවතු වගාවක් ලෙස පොල් වගා කිරීමත් ආර්ථිකයට වාසිදායක වන බව.

**(iii) මෙවැනි කරුණු තුනක් ඇසුරින් විස්තර කර තිබිය යුතුය.**
**කරුණු තුන නම් කිරීමට ලකුණු** = 03
**නිදසුන් දක්වමින් විස්තරයට ලකුණු** = 02
05

**4.** (i) කර්මාන්ත ස්ථානගතවීමට බලපාන බලශක්ති සාධකයට අයත් ශක්ති මූල **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිත ප්‍රවණතා **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්තකරුවන් එම කර්මාන්තය සම්බන්ධයෙන් මුහුණපාන ගැටළු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(b) ඔබ ඉහත (iii) (a) හි සඳහන් කළ ගැටළු නිරාකරණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(i) • ගල් අඟුරු
• ඛනිජ තෙල්
• ජල විදුලිය
• න්‍යෂ්ටික බලය
• සූර්ය ශක්තිය

**(i) මින් දෙකක් නම් කිරීමට = 1 + 1 ලකුණු** 02

(ii) • විශේෂ ගුණාංගවලින් යුතු යකඩ හා වානේ නිපදවීම (කල් පැවැත්ම - ශක්තිය - දරා සිටීමේ හැකියාව - නම්‍යශීලි බව - කම්පනයට ඔරොත්තු දීමේ හැකියාව වැනි ගුණාංග)

- වෙනත් ලෝහවලට මිශ්‍ර කිරීමෙන් ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට හැකිවීම (ඇලුමිනියම් හා තඹ සමඟ)
- සුන්බුන් යකඩ හා පරණ යකඩ ප්‍රතිචක්‍රීකරණය කර නැවත ප්‍රයෝජනයට ගැනීම.
- පැරණි තාක්ෂණයෙන් බැහැරව නිෂ්පාදන කටයුතු නවීකරණය වී තිබීම. (යපස් උණු කිරීමට, ගල් අඟුරු වෙනුවට විදුලි උදුන භාවිතය)
- අතීතයේ යකඩ හා වානේ නිෂ්පාදයට ප්‍රමුඛ වූ ඇතැම් රටවල් වෙළෙඳපොලෙන් පසු බැසීම.
- නැගෙනහිර අසියාතික රටවලින් යකඩ හා වානේවලට ඇති ඉල්ලුම ඉහළයාම නිසා නව වෙළෙඳපොලක් නිර්මාණය වීම. නිදසුන් : චීනය, දකුණු කොරියාව
- ජාත්‍යන්තර වෙළෙදාමේ දී වානේ අපනයනය කරන ඇතැම් රටවල් වානේ ආනයනය කිරීමද සිදු කිරීම. නිදසුන් : චීනය, දකුණු කොරියාව
- අතීතයේ අමුද්‍රව්‍ය පිහිටි ප්‍රදේශවල ස්ථානගත වූ කර්මාන්තය වර්තමානයේ ප්‍රාග්ධනය හා වෙළඳපොල මත ස්ථානගතවීමේ නැඹුරුවක් පැවතීම.

**(ii) මෙවැනි ප්‍රවනතා තුනක් නම් කිරීමට**
**1X3 = ලකුණු** 03

(iii) (a)
- අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලු.
- පාරම්පරික ගෘහ කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ශ්‍රමය හිඟවීම.
- පුහුණු ශ්‍රමය හිඟවීම.
- නිෂ්පාදවලට ආදේශන භාණ්ඩ ආනයනය මඟින් ඇතිවන බලපෑම.
- නිෂ්පාදන වියදම් ඉහළ යාම හා ප්‍රාග්ධන පහසුකම් අඩු වීම.
- නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ගැටලු.
- සම්ප්‍රදායික දැනුම අභාවයට යාම සහ නව පරපුර එම කර්මාන්ත සඳහා යොමු නොවීම.
- තාක්ෂණය සම්බන්ධ ගැටලු.

**මෙවැනි ගැටලු තුනක් නම් කිරීම = 1X3 = ලකුණු** 03

(b)
- ගෘහ කර්මාන්ත සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීම (රජය මඟින්)
- අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා සහනදායී වැඩ පිළිවෙලක් රජය මඟින් සලසා දීම (නිදඃ මැටි/ වේවැල්)

- අමු ද්‍රව්‍ය සපයා ගැනීමට බාධක වන නීති රීති ලිහිල් කිරීම.
- මෙම කර්මාන්ත නගා සිටුවීම සඳහා මධ්‍යම රජය මෙන්ම පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන්ද අනුග්‍රහයක් ලබාදීම.
    - දිවි නැගුම ජාතික සංවර්ධන වැඩ සටහන
    - කර්මාන්ත ගම්මාන ඇති කිරීම
    - හස්ත කර්මාන්ත සංවර්ධන වැඩ සටහන
    - ප්‍රදර්ශන පැවැත්වීම වැනි වැඩ පිළිවෙළවල් මගින් කර්මාන්තකරුවන් දිරි ගැන්වීම
- රජයේ අනුග්‍රහය ඇතිව අලෙවි කිරීමේ පහසුකම් දියුණු කිරීම (දේශීය හා විදේශිය)
- මිනිස් ශ්‍රමය සමග නව තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර භාවිතය හඳුන්වා දීම.
- ණය පහසුකම් සළසා දීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වෙනම අමාත්‍යාංශ පිහිටුවීම. (එක් එක් කර්මාන්ත වලට අදාළව)

**(iii) (a) හි සඳහන් ගැටලුවලට අදාළව ඒවා නිරාකරණයට ගතහැකි ක්‍රියා මාර්ග දෙකක් යෝජනා කිරීමට ලකුණු** - 02

| | | |
|---|---|---|
| **(iii) (a)** | - | **03** |
| **(b)** | - | **02** |
| | - | **05** |

**5.** (i) ශ්‍රී ලංකාවේ වගා කරන එළවළු වර්ග අතුරෙන්
(a) කඳුකර කලාපයේ බහුලව වගා කරන එළවළු වර්ගයක් ද,
(b) වියළි කලාපයේ බහුලව වගා කරන එළවළු වර්ගයක් ද නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ශ්‍රී ලංකාවේ එළවළු ගොවීන් මුහුණපාන ගැටළු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) (a) ව්‍යාපාරික වශයෙන් ශ්‍රී ලංකාවේ වගා කරන පළතුරු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(b) පළතුරු නිෂ්පාදනය මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග **දෙකක්** යෝජනා කර ඉන් **එකක්** පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 03 යි)

(i) (a) • ලීක්ස් • ගෝවා • බෝංචි • කැරට් • අර්තාපල් • බිට් රූට්
• නෝකෝල්............ මින් එකක් නම් කිරීම

(b) • මුරුංගා • මෑකරල් • තක්කාලි • වම්බටු • කැකිරි • කරවිල • වට්ටක්කා
• පිපිඤ්ඤා............ මින් එකක් නම් කිරීම

**(i) (a) 1 (b) 1 = 02**

(ii) • ප්‍රමාණවත් ගබඩා පහසුකම් හා ශීතාගාර පහසුකම් නොමැතිවීම.
• අවශ්‍ය ප්‍රවාහන පහසුකම් නොමැතිවීම. (ප්‍රවාහනයේදී අපතේ යාම)

Department of Examinations - Sri Lanka

- ප්‍රමිතියකින් තොර බීජ භාවිතය නිසා වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම.
- නිෂ්පාදන මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවීම.
- දේශීය වෙළෙඳපොලේ ස්ථාවර මිලක් නොතිබීම.
- අතරමැදියන්ගේ ග්‍රහනයට හසුවීම නිසා ගොවියාගේ ආදායම අඩුවීම.
- කෘමි හා වසංගත රෝගවලට ලක් වීම.
  නිද: පිටි මකුණා බෝවීම
- ගංවතුර. නියඟ, අධික වර්ෂාපතනය හා නායයාම් මඟින් වගා හානි සිදුවීම.
- නිෂ්පාදන වියදම් අධික වීම.
- බීජ වර්ගවල මිල අධික වීම.
- පෙහොර භාවිතයේ ගැටලු - (පෙහොර මිල අධික වීම.)

**(ii) මෙවැනි ගැටලු තුනක් සඳහන් කිරීමට ලකුණු** 03

(iii) (a) • කෙසෙල් • අන්නාසි • අඹ • පැෂන් ෆෘට් • මිදි • පැපොල් • අලි පේර • දොඩම් • ඩ්‍රැගන් ෆෘට් • රඹුටන් • පේර • දූරියන්

(a) **මෙවැනි වර්ග දෙකක් නම් කිරීමට = ලකුණු** 02

(b) • ප්‍රමාණවත් ගබඩා පහසුකම් හා ශීතාගාර පහසුකම් සැපයීම.
• පළතුරු ප්‍රවාහනයේ දී සිදුවන හානි හා නාස්තිය වැලැක්වීම සඳහා ප්‍රවාහන ක්‍රමවල වෙනස්කම් හඳුන්වා දීම.
• පළතුරු ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගකරණයට උනන්දු කරවීම.
• පළතුරු වගාව හා නිෂ්පාදන පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
  - නව වගා ක්‍රම
  - නිෂ්පාදනය හා සම්බන්ධ නව ශිල්පීය දැනුම ලබාදීම
  - උපදේශන සේවා සැපයීම
• නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වගාකරුවන්ට සහනාධාර සැපයීම.
• පළතුරු වගාව හා නිෂ්පාදනය සඳහා රජයේ අනුග්‍රහය ලබාදීම.
  - අපනයන බදු සහන
  - නව වෙළෙඳපොලවල් සපයාදීම - (දේශීය/ විදේශීය)
  - පොහොර සහනාධාර ලබාදීම
  - අපනයන ගම්මාන පිහිටුවීම

(b) **ක්‍රියා මාර්ග දෙකක් යෝජනා කිරීමට = ලකුණු** 02
**එකක් කෙටියෙන් විස්තර කිරීමට = ලකුණු** <u>01</u>
<u>03</u>

(iii) (a) **ලකුණු** - 02 }
(b) **ලකුණු** - 03 } 05

Department of Examinations - Sri Lanka

6. (i) ලෝකයේ ක්ෂයවෙමින් පවතින ස්වභාවික සම්පත් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ශ්‍රී ලංකාවේ පාංශු සම්පත පරිහරණය හා සම්බන්ධ ගැටළු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) (a) ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් භාවිතයේ දී පරිසරයට සිදුවන හානි **දෙකක්** සඳහන් කරන්න.(ලකුණු 02 යි)
(b) ඔබ ඉහත (iii) (a) හි දැක්වූ හානි වළක්වා ගැනීමට ගත හැකි **එක්** ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(i) • පොසිල ඉන්ධන • වනාන්තර • සරුපස • පාෂාණ
• යපස්, තඹ, රන් වැනි ලෝහමය ඛනිජ
• ගල් අඟුරු, මැණික්, සිලිකා වැනි අලෝහමය ඛනිජ

(i) **මෙවැනි සම්පත් දෙකක් නම් කිරීමට = ලකුණු 02**

(ii) • අධික ලෙස පාංශු ඛාදනය වීම.
• පස ලවනීකරණය වීම.
• පසේ ජලය රඳවාගත හැකි ප්‍රමාණය අඩුවීම.
• පස නිරාවරණය වීම නිසා පසෙහි සාරවත් බව අඩුවීම.
• අධික ලෙස රසායනික පොහොර, කෘමි නාශක හා වල් නාශක භාවිතය නිසා පස හායනයට ලක්වීම.
• නාය යෑම ගංවතුර වැනි ස්වභාවික විපත් තීව්‍ර වීම.
• භූගත ජල ගබඩාවට ඇති කරන වෙනස්කම්
• පාංශු ජීවීන් විනාශ වීම.

**මෙවැනි ගැටලු තුනක් නම් කිරීම = 1X3 = ලකුණු 03**

(iii) (a) • ඛනිජ සම්පත් කැනීමේදී භාවිත කරනු ලබන ඇතැම් තාක්ෂණික ක්‍රම මඟින් පරිසරය දූෂණය වීම.
• ගංගා ආශ්‍රිත වැලි ඉවත් කිරීම නිසා ගං ඉවුරු ඛාදනය වීම. ගංගා පිටාර ගැලීම ලවන ජලය රට තුළට ගලාඒම නිසා වගා හානි සිදුවීම.
• පතල් කැනීම නිසා වලවල් ඇතිවීම පස් කඩා වැටීම, නායයෑම් ඇති වීම.
• ජලය පිරුණු වලවල් ආශ්‍රිතව මදුරු වසංගත රෝග බෝවීම, බැක්ටීරියා වර්ග ඇතිවීම.
• ගංගා ඇළ දොළවල රොන්මඩ තැන්පත්වීම නිසා ජල ගැලීම් හට ගැනීම.
• පාරිසරික වශයෙන් වෘක්ෂලතාවලට හානි සිදුවීම.
• වගාබිම් විනාශ වීම.
• ජලය, ගොඩබිම හා වායුව දූෂණය වීම.
• ජලජ ජීවීන් හා පාංශු ජීවීන් විනාශ වීම.

Department of Examinations - Sri Lanka

- ස්වාභාවික සෞන්දර්යය නැතිවීම.

**(a) මෙවැනි පරිසර හානි දෙකක් නම් කිරීම** = ලකුණු 02

(b)
- ඛනිජ කැනීම් විධිමත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- ඛනිජ සම්පත් කැනීමේ දී අපතේ යාම වළක්වාලීම.
- පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.
- ඛනිජ කැනීම, ප්‍රවාහනය හා භාවිතය විධිමත් කිරීම.
- ඛනිජ සෑරීමෙන් පසු අත්හැර දමන ලද වලවල් මදුරු වසංගත හා බැක්ටීරියා වර්ග ඇතිවීම වැළැක්වීමට පියවර ගැනීම.
- තාක්ෂණය වාඩාත් කාර්යක්ෂම කිරීම.

**(b) හානි වළක්වා ගැනීමේ ක්‍රියා මාර්ගයක් විස්තර කිරීම සඳහා ලකුණු** = 03

**(iii) (a) 02 + (b) 03** = 05

Department of Examinations - Sri Lanka

**7.** (i) ලෝකයේ නියඟ ආපදාව බහුලව දැකිය හැකි ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නියඟ ආපදාව නිසා

(a) භෞතික පරිසරයට සිදුවන බලපෑමක් ද,

(b) සමාජ පරිසරයට සිදුවන බලපෑම් **දෙකක්** ද සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදාව අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(i)
- මධ්‍යම අප්‍රිකානු සාහේල් කලාපය.
- උතුරු ඇමරිකාවේ මිඩ්වෙස්ට් ප්‍රදේශය.
- මධ්‍යම ඕස්ට්‍රේලියාව
- ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර, ගුජරාට්, හයිද්‍රාබාද් ප්‍රදේශ.
- වයඹ දිග චීනය

**මින් දෙකක් නම් කිරීමට ලකුණු** 1 +1 = 02

(ii) (a)
- පස නිසරුවීම.
- ජෛව විවිධත්වය බිඳ වැටීම.
- වෘක්ෂලතා වැස්මට හානි සිදුවීම.
- ස්වාභාවික සෞන්දර්යය විනාශ වීම.
- කාන්තාරීකරණය වීම.
- ලැව්ගිනි ඇතිවීම.

**(a) මින් එකක් නම් කිරීමට ලකුණු** = 01

(b)
- තීව්‍ර ජල හිඟයක් ඇතිවීම.

- කෘෂිබිම් විනාශවීම.
- ජල විදුලි උත්පාදනයට බාධා ඇතිවීම.
- රෝග හා සාගතවලින් සතුන් හා මිනිසුන් පිඩාවට පත්වීම.

**(b) මින් දෙකක් නම් කිරීමට ලකුණු** = 02

**(ii) (a) 1 + (b) 2** = 03

(iii)
- බෑවුම් සහිත ඉඩම්වල ඇති වෘක්ෂලතා වැස්ම ආරක්ෂා කිරීම.
- ස්වාභාවික ජලවහනය අවහිර නොකිරීම.
- බෑවුම් සහිත ඉඩම් පරිහරණයේදී විද්‍යාත්මක උපදෙස් අනුගමනය කිරීම.
- උස් ප්‍රදේශවල ජලාශ ඉදි නොකිරීම.
- ශීඝ්‍ර බෑවුම් සහිත ඉඩම්වල ගොඩනැගිලි ඉදි නොකිරීම.
- බෑවුම් සහිත ඉඩම්වල ස්ථායිතාව ආරක්ෂාවන පරිදි ක්‍රියා මාර්ග ගැනීම - (ගල් වැටි/ කුට්ටි කානු/ වන වගා)
- ප්‍රජාව දැනුවත් කිරීම.

**(iii) ක්‍රියා මාර්ග තුන නම් කිරීමට** = **ලකුණු** 03

**එකක් විස්තර කිරීමට** = <u>**ලකුණු** 02</u>

<u>05</u>

**8.** (i) ගෝලීය උෂ්ණත්වය ඉහළයාම කෙරෙහි බලපාන
(a) මානුෂ ක්‍රියාකාරකමක් ද,
(b) ස්වභාවික හේතුවක් ද සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළයාම නිසා පාරිසරික වශයෙන් ඇතිවන අහිතකර බලපෑම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගෝලීය උෂ්ණත්වය ඉහළයාම අවම කිරීම සඳහා පුරවැසියකු වශයෙන් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කර ඉන් **එකක්** පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05 යි)

Department of Examinations - Sri Lanka

(i) (a)
- පොසිල ඉන්ධන අධික ලෙස භාවිතය හා දහනය.
- වන හායනය.
- කාර්මීකරණය.
- සත්ව පාලනය (වමාරා කන සතුන්)
- ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම.
- වනාන්තර ගිනි තැබීම්.
- න්‍යෂ්ටික අත්හදා බැලීම්.
- සම්පත් අධිපරිභෝජනය හා නාස්තිය.

**(a) මින් එකක් නම් කිරීමට ලකුණු** = 01

(b)
- ගිනි කඳු පිපිරීම.
- ළැව් ගිනි.

- ස්වාභාවික වගුරුබිම්.
- වායු ගෝලය තුළ සිදුවන ස්වාභාවික වෙනස්කම්.
- සූර්ය ලප

**(b) මින් එකක් නම් කිරීමට ලකුණු** = 01

**(i) (a) 1 + (b) 1** = 02

(ii)
- දේශගුණ වෙනස්කම් හට ගැනීම.
- ධ්‍රැව ප්‍රදේශවල අයිස් වැස්ම දියවීම නිසා මුහුදු මට්ටම ඉහළ යාම.
- කලපු විනාශ වීම හා ජලය ලවනීකරණය වීම.
- සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වී ජලජ ජීවීන් විනාශ වීම.
- සාගර මතුපිට උෂ්ණත්වය වැඩිවීම නිසා සුළි කුණාටු තත්ව ඇති වීම.
- දේශගුණ කලාප මායිම් වෙනස්වීම.
- ඇතැම් ජීවීන් වඳවී යාම හා නව ගහන බිහිවීම.
- භෝග විනාශය හා අස්වැන්න අඩු වීම.
- සත්ව අභිජනන කලාප වෙනස් වීම.
- පානීය ජල මූලාශ්‍ර දූෂණයට ලක් වීම.

**(ii) මෙවැනි බලපෑම් තුනක් නම් කිරීම = 1X3** = ලකුණු 03

(iii)
- හරිතාගාර වායු වර්ග පිට කරන බලශක්ති ප්‍රභව අඩුවෙන් පරිහරණය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති (සුළං/ සූර්ය ශක්තිය) භාවිතය දිරි ගැන්වීම.
- භෝග වගාව සඳහා රසායනික පොහොර වෙනුවට ඓන්ද්‍රිය පොහොර භාවිතයට දිරි ගැන්වීම.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම.
- වන වගාව ව්‍යාප්ත කිරීමට රුකුල් දීම (රුක් රෝපන වැඩසටහන්)
- පොදු ප්‍රවාහන පහසුකම් ප්‍රයෝජනයට ගැනීම.
- මිශ්‍ර බෝග/ බහු බෝග වගාවන් හඳුන්වා දීම.
- ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සහය වීම.

**(iii) ක්‍රියා මාර්ග තුන නම් කිරීමට** = ලකුණු 03
**එකක් විස්තර කිරීමට** = ලකුණු 02
05

Department of Examinations - Sri Lanka